DOI: 10.31357/fhssmst.2007.00103

# කාන්තාවන්ට එරෙහිව සිදුවන ලිංගික අපරාධ පිළිබඳ අධ්‍යයනයක්

## (කොළඹ දිස්ත්‍රික්කය සහ රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්)

එදිරිසිංහ ආරච්චිගේ අනුෂා එදිරිසිංහ

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ
අවශ්‍යතා සපුරාලීම සඳහා 2007.03.29 දින ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

**Funded by Swedish International Development Agency**
**(SIDA /SARREC) project**
**“Health & Social Care for Socially Marginalised People**

## කර්තෘගේ ප්‍රකාශය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා මහතා සහ ආචාර්ය එම්.සී.ස්වර්ණලතා පෙරේරා මහත්මියගේ මාර්ගෝපදේශකත්වය යටතේ සම්පාදනය කරනු ලැබුවකි. මෙහි අන්තර්ගත කිසිදු කරුණක් වෙනත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බව සහතික කරමි.

2007/09/28

දිනය

ඊ.ඒ.ඒ.එදිරිසිංහ

## උපදේශකවරුන්ගේ සහතිකය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඊ.ඒ.ඒ.එදිරිසිංහ විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය අපගේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටම පවතින බව තව දුරටත් මෙයින් සහතික කරමි.

------------------------------------

මහාචාර්ය බී.ඒ ටෙනිසන් පෙරේරා

28/9/07

------------------------------------

දිනය

------------------------------------

ආචාර්ය එම්.සී ස්වර්ණලතා පෙරේරා

------------------------------------

දිනය

28 SEP 2007

| **පටුන** | **පිටු අංකය** |
|---|---|
| ➢ පටුන | I-III |
| ➢ සංඛ්‍යා වගු සහ ප්‍රස්ථාර | IV-VII |
| ➢ රූප සටහන් | VIII |
| ➢ ස්තුතිය | IX |
| ➢ සංක්ෂිප්තය | X |
| ➢ **පළමුවැනි පරිච්ඡේදය** | |
| **පර්යේෂණ ක්‍රමවේදය** | **1-25** |
| 1.1 හැඳින්වීම | |
| 1.2 අධ්‍යයනයේ අරමුණු | |
| 1.3 ගැටලුව සහ උපන්‍යාසය | |
| 1.4 මූලාශ්‍රයයෝ | |
| 1.5 අධ්‍යයන ක්ෂේත්‍රය | |
| 1.6 නියැදිය | |
| 1.7 දත්ත රැස් කිරීම | |
| 1.8 අධ්‍යයනයේ සීමා | |
| 1.9 පර්යේෂණ දුෂ්කරතා | |
| 1.10 දත්ත විග්‍රහය | |
| 10.11 පරිච්ඡේදකරණය | |

➢ දෙවැනි පරිච්ඡේදය

**සංකල්පීය විග්‍රහය සහ න්‍යායාත්මක පසුබිම** 26-96

2.1 කාන්තාව පිළිබඳ අර්ථනිරූපණ

2.2 අපරාධ පිළිබඳ අර්ථ නිරූපණ

2.3 අපරාධ වර්ගීකරණය

2.4 කාන්තාවන්ට එරෙහිව සිදුවන වෙනත් ලිංගික අපරාධ

2.5 ලිංගික අපරාධ න්‍යායයන්

➢ තෙවැනි පරිච්ඡේදය

**කාන්තාවන්ට එරෙහිව සිදුවන ලිංගික**

**අපරාධවල ස්වභාවයන්** 97-113

3.1 කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ පිළිබඳ
ජාත්‍යන්තර තත්ත්වය

3.2 ස්ත්‍රී දූෂණ

3.3 ව්‍යභිචාරය

3.4 අසභ්‍ය ප්‍රකාශන

3.5 ලිංගික පහරදීම්

3.6 ලිංගික අතවර

➢ හතරවැනි පරිච්ඡේදය 114-192

**ක්ෂේත්‍ර අධ්‍යයනය සහ දත්ත විශ්ලේෂණය.**

4.1 කැලණිය පොලිස් කොට්ඨාසයෙහි සිදු වු ලිංගික අපරාධ

4.2 රත්නපුර පොලිස් කොට්ඨාසයෙහි සිදු වූ ලිංගික අපරාධ

4.3 වින්දිතයන්ගේ මූලික තොරතුරු සහ ලිංගික අපරාධ

4.4 අපරාධ යුක්ති පද්ධතිය

4.5 ලිංගික අපරාධ සම්බන්ධ වෛද්‍ය පරීක්‍ෂණ

4.6 ලිංගික අපරාධයට ගොදුරු වීමෙන් පසු ගන්නා ලද පියවර

4.7 ලිංගික අපරාධ සම්බන්ධ සමාජ ප්‍රතිරූපය

4.8 පොලිස් නිලධාරීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා

4.9 අධිකරණ වෛද්‍ය නිලධාරීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා

4.10 නීතිඥයින් සමඟ කළ සම්මුඛ සාකච්ඡා

4.11 සිද්ධි අධ්‍යයන

- **පස්වැනි පරිච්ඡේදය** **193-199**

5. ලිංගික අපරාධ වලට ගොදුරු වූ කාන්තාවන් මුහුණපාන ගැටලු

- **හයවැනි පරිච්ඡේදය** **200-230**

**කාන්තාවන්ට එරෙහි ලිංගික අපරාධ පාලනය හා වැළැක්වීම.**

6.1 පොලිසියේ කාර්යභාරය

6.2 වෛද්‍ය පරීක්ෂණ

6.3 සැකකරු අත්අඩංගුවට ගැනීම සහ අධිකරණයට ඉදිරිපත් කිරීම

6.4 අධිකරණයේ කාර්යභාරය

6.5 රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන

6.6 අණපනත්

6.7 ජාත්‍යන්තර නීතිය

➢ **හත්වැනි පරිච්ඡේදය** **231-238**

**නිගමන සහ යෝජනා**

7.1 නිගමන

7.2 යෝජනා

➢ **ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** **239-249**

➢ **ඇමුණුම්**

## සංඛ්‍යා වගු අංක

වගු අංක — පිටු අංකය


පළමුවැනි පරිච්ඡේදය

වගු 1.1 කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ — 05

වගු 1.2 කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ අනුපාතය — 07

තුන්වැනි පරිච්ඡේදය

වගු 3.1 රටවල් කිහිපයක කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ — 98

හතරවැනි පරිච්ඡේදය

වගු අංක 4.1 කැලණිය පොලිස් කොට්ඨාසය තුළ ලිංගික අපරාධ — 115

වගු අංක 4.2 රත්නපුර පොලිස් කොට්ඨාසය තුළ ලිංගික අපරාධ — 116

වගු අංක 4.3 පෞද්ගලික තොරතුරු — 117-118

වගු අංක 4.4 රැකියාව සහ ආදායම — 120

වගු අංක 4.5 නිවසේ සිට රැකියා ස්ථානයට ඇති දුර — 127

වගු අංක 4.6 නිවසේ පිළිබඳ විස්තර — 128

වගු අංක 4.7 කාන්තාවන්ට සිදු වූ ලිංගික අපරාධ — 132

වගු අංක 4.8 අපරාධ භූමිය සහ අපරාධය සිදු වූ වේලාවන් — 137

වගු අංක 4.9 වරද කළ පුද්ගලයා හඳුනා ගැනීම — 143

වගු අංක 4.10 සිද්ධිය පිළිබඳ කතා කළ පුද්ගලයා — 149

වගු අංක 4.11 උපදෙස් ලබා ගැනීම — 149

වගු අංක 4.12 අපරාධය පිළබඳ තොරතුරු ලබා දුන් අංශය — 153

වගු අංක 4.13 අධිකරණයේ පෙනී සිටීම — 157

හයවැනි පරිච්ඡේදය


වගු අංක 6.1 - 365 වගන්තිය යටතට ගැනෙන ලිංගික ක්‍රියා 207

වගු අංක 6.2 - ලිංගික අපරාධ විභාග කරන අධිකරණ 218

වගු අංක 6.3 - චූදිතයින් සිරභාරයට ගැනීම හා ඇපදීම 219-220

## ප්‍රස්ථාර


| ප්‍රස්ථාර අංක | පිටු අංක |
|---|---|
| **පළමුවැනි පරිච්ඡේදය** | |
| 1.1 ස්ත්‍රී දූෂණ | 07 |
| 1.2 ලිංගික අතවර | 08 |
| **හතරවැනි පරිච්ඡේදය** | |
| 4.1 විවාහක අවිවාහකභාවය | 119 |
| 4.2 රැකියාවල නිරතවීම | 121 |
| 4.3 කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ | 133 |
| 4.4 අපරාධය සිදු වූ ස්ථානයන් | 138 |
| 4.5 අපරාධය කළ පුද්ගලයින් | 144 |
| 4.6 ලිංගික අපරාධය වාර්තා කළ ස්ථානය | 153 |
| 4.7 වෛද්‍ය පරීක්ෂණයට යොමු කිරීම | 156 |

## රූප සටහන්

රූප සටහන් | පිටු අංකය


**පළමුවැනි පරිච්ඡේදය**

1.1 මූලාශ්‍රයෝ 09

**දෙවැනි පරිච්ඡේදය**

2.1 අපරාධ වර්ගීකරණය 37

2.2 කාන්තාවන්ට ලිංගික අපරාධ සිදුවන ස්ථාන 67

2.3 ලිංගික අපරාධ කරනු ලබන පාර්ශවයන් 68

2.4 ප්‍රචණ්ඩත්වය පිලිබඳ චක්‍රය 70

2.5 කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ සම්බන්ධ න්‍යායන් 72

2.6 ආක්‍රමණශීලීත්වයේ ස්වභාවය 79

2.7 සමාජ බැඳුම් න්‍යාය 87

2.8 සමාජ බැඳුම් න්‍යායට අනුව ලිංගික අපරාධ ජනිත වන ආකාරය 90

# ස්තූතිය

★මාගේ ප්‍රධාන උපදේශකවරුන් ලෙස කටයුතු කරමින් මා දිරිමත් කළ මහාචාර්ය බී.ඒ ටෙනිසන් පෙරේරා මහතාට සහ ආචාර්ය එම්.සී ස්වර්ණලතා පෙරේරා මහත්මියට, ආචාර්ය යසාංජලී දේවිකා මහත්මියට, පර්යේෂණ කටයුතු නිරතුරු දිරිමත් කළ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිතුමිය වන මහාචාර්ය කුමුදු විජේවර්ධන මහත්මියට

★පර්යේෂණ නිබන්ධයෙහි සෝදුපත් කියවීම හා ඒ පිළිබඳ සොයා බලා නිබන්ධයේ අවසානය තෙක් මා දිරිමත් කළ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර ඇදුරුතුමන් ඇතුලු ආචාර්ය මණ්ඩලයට,

★භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංඝසුමන හිමියන්ට, වෛද්‍ය පීඨයේ ප්‍රජා වෛද්‍ය අංශයේ කථිකාචාර්ය වෛද්‍ය චාමර මහතාට, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ කාර්ය මණ්ඩලයට,

★අධ්‍යයනය සඳහා අවශ්‍ය සියලුම මුල්‍යමය ආධාර ලබා දෙමින් එම කටයුතු සඳහා උපදේශකත්වය ලබා දුන් උප්සලා විශ්වවිද්‍යාලයේ කාන්තා හා ළමා සෞඛ්‍ය අංශයේ මහාචාර්ය Gunilla Linmark, Dr. Pia Axemo, (SIDA SARREC Project) සමාජ භූගෝල විද්‍යා අංශයේ Dr.Aida මහත්මියට හා Dr.Henrica Jansen (WHO) යන මහත්මීන්ට,

★ පර්යේෂණ නිබන්ධයේ අවසානය තෙක් මා හට ශක්තියක් වූ මාගේ ආදරණීය උපාලි අයියාට,

★ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා සම්බන්ධ වු මිතුරියන් වන කාන්ති, ධම්මි, රංජි සහ චම්පිකා, වජිරා, මුතුනායක, තමරා, ප්‍රියංකා, චාන්දනි, චතුරිකා, පුෂ්පිකා යන සිසුවියන්ට, ඉන්දික,සංඛ, නලින්ද යන මල්ලිලාට

★ දත්ත රැස් කිරීමේ දී අවශ්‍ය තොරතුරු ලබා දෙමින් පර්යේෂණය අවසානය දක්වා සහාය දැක්වු කැලණිය පොලිස් මුලස්ථානයේ කාන්තා කාර්යාංශයේ හිටපු ස්ථානාධිපතිතුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට, රත්නපුර පොලිස් මුලස්ථානයේ කාර්යාංශයේ ස්ථානාධිපතිතුමිය සහ මහජන සම්බන්ධතා නිලධාරි කොලින් ආරියරත්න මහතාට, පොලිස් කොට්ඨාසයන්හි සියලුම පොලිස් ස්ථානයන්හි කාන්තා කාර්යාංශයේ නිලධාරිනියන්ට

★ පර්යේෂණයේ ප්‍රධාන මූලාශ්‍රය වන සියලුම දත්තදායිකාවන්ට


28 SEP 2007

## සංක්ෂිප්තය

කාන්තාවන්ට එරෙහිව සිදු වන ලිංගික අපරාධ විශ්වීය ගැටලුවකි. ලෝකයේ පවත්නා විවිධ සංස්කෘතීන් තුළින් මෙම තත්ත්වය හඳුනා ගත හැකිය. ඒ අනුව කාන්තාවන්ට එරෙහිව සිදු වන ලිංගික අපරාධ, ශ්‍රී ලංකාවේ ද සමාජ ගැටලුවක් බවට පත්ව ඇත. ඒ තුළින් කාන්තාවන්ට ශාරීරිකව මානසිකව ලිංගික වශයෙන් සිදු වන හානිය ප්‍රබල වේ. කාන්තාවන්ට එරෙහිව සිදු වන ලිංගික අපරාධ හේතුවෙන් කාන්තාවන් මුහුණ දෙන ගැටලුකාරී තත්ත්වය පිළිබඳ අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කිරීම මෙහි දී සිදුවිය.

සමාජ පැවැත්මේ නියමුවා වන කාන්තාවට සිදු වන ලිංගික අපරාධ අතර ස්ත්‍රී දූෂණය, බරපතල ලිංගික අපරාධයකි. එයට අමතරව ලිංගික අතවර, බරපතල ලිංගික අපයෝජනය මෙන්ම කාමෝද්දීපන රචනා, කුට්ටනය, අස්වාභාවික වැරදි ආදිය ද සිදු වේ. ශ්‍රී ලංකාවේ පවතින මෙකී ස්වභාවය විමර්ශනය කළ අතර ලෝකයේ ලිංගික අපරාධ වල ස්වභාවය විමසීම ද සිදු කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය තුළ සිදුවන ලිංගික වැරදි අධ්‍යයනය කරමින්, කාන්තාව නිවස තුළ මහ සමාජය තුළ ලිංගික අපරාධයන්හි වින්දිතයන් වීම නිසා අපරාධ යුක්ති පද්ධතිය තුළ දී ඇය මුහුණ දෙන ගැටලු විමසීම මෙම පර්යේෂණයේ දී සිදුවිය. කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ පාලනය සහ වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන්නා වු විවිධ වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කළ අතර අපරාධ යුක්ති පද්ධතිය හා සම්බන්ධ ගැටලු මොනවාද යන්න විමසන ලදී. එම ආයතනයන්හි පවතින ගැටලු සහ කාන්තාවන් මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවිය. කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ පිළිබඳ මෙම පර්යේෂණාත්මක නිබන්ධයෙන් අවුරුදු දහ අටට වැඩි කාන්තාවන් මුහුණ දෙන්නාවු මෙකී ගැටලුව අධ්‍යයනය කෙරිණි.

# පළමුවැනි පරිච්ඡේදය

# පර්යේෂණ ක්‍රමවේදය

1.1 හැඳින්වීම

1.2 අධ්‍යයනයේ අරමුණු

1.3 ගැටලුව සහ උපන්‍යාසය

1.4 මූලාශ්‍රයයෝ

1.5 අධ්‍යයන ක්ෂේත්‍රය

1.6 නියැදිය

1.7 දත්ත රැස්කිරීම

1.8 අධ්‍යයනයේ සීමා

1.9 පර්යේෂණ දුෂ්කරතා

1.10 දත්ත විග්‍රහය

10.11 පරිච්ඡේදකරණය

1.මාතෘකාව

**(Title)**

කාන්තාවන්ට එරෙහිව සිදුවන ලිංගික අපරාධ පිළිබඳ අධ්‍යයනයක්

(රත්නපුර දිස්ත්‍රික්කය හා කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්)

1.1 හැඳින්වීම

**(Introduction)**

කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ පමණක් නොව අනෙකුත් රටවල ද පොදු සමාජ ගැටළුවකි. මෙය සමාජයේ දක්නට ලැබෙන නව තත්ත්වයක් නොව අතීතයේ සිට පැවත ආවකි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යටතේ සාකච්ඡාවට බඳුන් වන එක් මාතෘකාවක් ලෙස කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ හැඳින්විය හැකිය. ප්‍රචණ්ඩත්වය නොයෙකුත් රටවල විවිධාකාරයෙන් පැහැදිලි කර ඇති අතර බොහෝ සමාජවල ප්‍රචණ්ඩත්වය ආක්‍රමණශීලිත්වය (Aggression) යනුවෙන් ද අර්ථ දක්වා තිබේ. ප්‍රචණ්ඩත්වය ශාරීරික දෙයක් බවත් එමගින් අන් අයගේ සිත් රිදවීමක් ඇති කරන බවත් පෙන්වා දී ඇත (Mahajan & Madurima,1995:17). මෙම නිර්වචනයට අනුව පුද්ගලයකුට ශාරීරික හා මානසික ලෙස පීඩා කිරීම ප්‍රචණ්ඩත්වයයි. පුද්ගලයින්ට දැඩි ශාරීරික හානි පමුණුවමින් සිදුවන වරදවල් ප්‍රචණ්ඩත්වය යටතේ අධ්‍යයනය කරනු ලබයි. කාන්තාවන්ට සිදුවන ලිංගික අපරාධ තුළින් සිදුවන ශාරීරික මෙන්ම මානසික හානිය ද ප්‍රබලය. ඒ අනුව ප්‍රචණ්ඩත්වය තුළින් මානසික ව්‍යාකුලතාවයන්, ලිංගිකව මෙන්ම වෙනත් ශාරීරික හානි කර තත්ත්වයන් වෙනත් රෝගී තත්ත්වයන් ද ජනිත වීමට පවතින සම්භාවිතාව ඉහළ අගයක් ගනී.